

# මතක පොතේ එක පිටුවක්

මා ඉතාම කුඩා සංදියේදී මට අත්දකින්නට ලැබුන සමහර සිද්ධීන් සහ පුද්ගලයන් පිළිබඳව මගේ යටිහිතේ තැම්පත් වී ඇති ඉතාම රසවත් මතකයන් අවධිවන විට අදද මට දැනෙන්නේ සිහිනයෙන් ගෑ සුවඳක් වැනි මිහිරිතම වචනයෙන් විස්තර කළ නොහැකි හැඟුම් මුදායකි.

මගේ මතකයේ රැඳුනු පුද්ගලයන් අතර සියනේරිස් උපාසක උන්නැහේට හිමිවන්නේ මූලිකම ස්ථානයකි. සමස් මාංසවලින් වැලකී සිටිමින් පස්පව් නොකරමින් හතර පෝයටම සිල් සමාදන් වූ මොහු වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම උපාසක මහතෙක් ම විය. මගේ වයස අවුරුදු පහ - හයක් පමණ තරමේ වනවිට සියනේරිස් උපාසක තැන වහස හැටත් හැට පහත් පැන තරමේ වයසේ සිටි දරු මුණුපුරන් දැක ජීවිතයේ අවසාන භාගය කරා ලඟාවී සිටි අයකු විය. සිහින් කෙට්ටු ශරීරයකට උරුමකම් කියූ මොහුගේ කොන්ද ද මදක් කුදු වී තිබූ නිසා නිහම වයසටත් වඩා වැඩි වයසක් ඔහු කෙරෙන් පලවූ බව මගේ හැඟීමයි.

ජීවිකා වාන්තිය වශයෙන් වළං කර්මාන්තය කළ සියනේරිස් උපාකගේ ගෙවල් පිහිටා තිබුණේ අපේ ඉඩමේ එක් කෙලවරක් පාමුලින් පිහිටා තබූ කුඹුරුවලට ඔබ්බෙන් වූ ඕව්ටේය. සියනේරිස් උපාසක තැනට ගමේ සැවොම මෙන් කැමැත්තක් දැක් වූ මුත් ඔහුගේ වළං වලට සම්බන්ධයෙන් නම් තිබුනේ වෙනම ම මතයකි. - සියනේරිස්ගේ වළං වලට ආයුෂ අඩුයි. තුන් හතර පාර ලිපේ තියන කොටම අඩිය ගැහෙනවා. ඔය මිනිහට සාස්තරේ හරියට පිහිටලා නෑ. මල් පෝච්චි කෙරුවාව හින්දා ඔහේ අල්ලගෙන යනවා." යි අපේ කිරි අම්මා නිතරම මෙන් කියූ එවදන්, ඇගේ මුවින් පිට වුවත්, එය ඇගේම තනි මතයට නොව ගම් වාසී බහුතරයක්ම එක්ව ඒකමතිකව ගත් තීරනයක් විය.

අද මෙන් සිමෙන්ති පෝච්චි බහුල නොවූ එකල මැටි පෝච්චි වෙළඳාමෙන් සියනේරිස් තම කුටුම්බ රක්ෂණය කිරීමේ දී ඔහු තම නිශ්පාදන අලෙවි කිරීමට කඩපොලට සහ ගමේ සති පොලට ගෙනයාම සඳහා යොදා ගත්තේ වලං කද නොව ලීයෙන් තැනූ කුඩා අත් කරත්තයකි.

සියනේරිස්ගේ මෙම අත්කරත්තය අනිවාර්යෙන්ම අවුරුද්දට දෙවතාවත් පමන පුණ්‍යකර්මයක

**සුභාෂිනී හේරත්**
ඇට්වුඩ්

නියැලුණු අන්දම මට මෙන්ම මගේ වයසේ එකල ගමේ සිටි දරු දැරියන්ට අදද නිරායාසයෙන් ම සිහියට නගා ගත හැකි බව මගේ හැඟීමය. අවුරුද්දකට දෙවතාවක් පමණ සියනේරිස් උපාසක තැන විසින් දෙනු ලැබූ බලු කපුටු දානය එම මහා පුණ්‍යකර්මය විය.

යල සහ මහ කන්න වැසි අස්වනු ගෙට ගත් පසු මුලින්ම පන්සලට කිරි ආහාර දානය දීමෙන් අනතුරුව දේවාලයේ කපු මහතා ගෙන් ගෙන් ගොස් එකතු කරන මුරුතැන් කඳට වී අයින් කිරීම ගමේ ගොවිතැන් බත් කළ ගෙවල්වල සිදු කලේ මහත් බක්තියෙනි.

මේ කාලයේදී ම සියනේරිස් උපාසක තැනක් ගමේ තෝරා ගත් ගෙවල් ගණනාවක ඇවිදිමින් ඔහුගේ දානයට ලක ලෑස්ති වෙයි. අත් කරත්තයත් තල්ලු කරගෙන අපේ ගෙදරට පැමිණෙන ඔහුට අපේ කිරි අම්මාගෙන් හාල් පොල්වලට අමතරව කලමනා ගැනීමට යයි කියා යම්කිසි මුදලක් ද අනිවාර්යෙන්ම ලැබුණි. -මැණිකෙ එහෙනම් දානෙ දවසට මේ ගෙදර ඉන්න උන්නැහෙලා දෙන්නටත් දානේ ටිකක් දෙමු නේදැයි" කියා ආරාධනාවක් ද කිරීමට සියනේරිස් උපාසක තැන කිසිදාක අමතක නොකරයි. සියනේරිස් බල්ලන්ව හැඳින්වූයේ - උන්නැහෙලා" යන පදයෙනි. කිසිම දිනක ඔහු බල්ලා යන වචනයෙන් එම සතුන්ව හඳුන්වනු මට ඇසී නැත.

දානේ දවසේ උදයෙම සියනේරිස් උපාසක තැනත්, ඔහුගේ බිරිඳ වූ පොඩිනා හාමිනේත් එකතු වී හාල්, කරවල, පරිප්පු, එළවළු වැනි සියළුම දේ එකට දමා දසත සුවඳ විහිදන එක විශාල බත් හැලියක් බල්ලන් සඳහාත් කපුටන් වෙනුවෙන් එළඟිතෙල් මිශ්‍රකල වෙනමම බත් හැලියකුත් පිසී. ඉන්පසු මෙම ආහාර පටවා ගන්නා අත් කරත්තය තල්ලු කරමින් තේක්ක කොළ, කිරි අල කොළ වැනි විශේෂ පිඟන්වලට -උන්නැහෙලාට" මේ ආහාර බෙදා දෙමින්, ඒ අතර වාරයේ කපුටන්ට එළඟි තෙල් මිශ්‍ර බත් දෙමින් මුළු ගම පුරාම ඇවිදියි.

කිසියම් හේතුවකින් සියනේරිස්ගේ දානය දිනය අපට අමතක වුවත් බල්ලන් බුරා හැලෙමින් හා කාකොටා වැටෙමින් ඇති කරන හඬට මුසු වූ කපුටන්ගේ නොනවතින -කාක් කාක්" හඬින් යුතුව ඇති වන මහා කාලගෝට්ටියෙන් ම ඈත තියාම අපට හඳුනා ගත හැකිය. බල්ලන්ට හා කපුටන්ට කියා වෙනම ම දානය බෙදා දෙන නමුත් කප්ටන් පලවා හැර බල්ලන් ඒ පංගුවටද වග කියනු දකින සියනේරිස් උපාසක තැන -ජේනවා නේද තිරිසනාගේ ගති සොබාවේ. තව ආත්ම ගනනාවක් ම ඔය විදියට සංසාරේ සැරිසරයි" කියමින් බණ පදයක් ද දෙසයි. -කපුටන්ගේ සුහද ගින්දර නිවන්න නම්, එළඟිතෙල් බත්ම දෙන්න ඕන. ඒකනෙ මම දානේ දෙයාකාරයකට උයන්නේ, උන්නැහෙලට කොහෙද ඒකේ වගක්" ඔහු උගණපූරනයක්ද එකතු කරයි.

සියනේරිස් උපාසක තැනගේ මෙම විශේෂ දානෙ දිනය අපේ ගමේ සිටි සමහර පොඩිත්තන්ට ද විශේෂ දිනයක්ම විය. සියනේරිස් තැනගේ අත් කරත්තය පිටුපසින් වැටී ඔහු හා ගම පුරා ඇවිදිමි-න්, දානෙ බෙදීම සඳහාම වූ -විශේෂ පිඟන්" බිමින් තැබීම වැනි දේවලින් පිංකමට සහභාගි වෙමින් ඔවුහු මහත් තෘප්තියක් වින්දහ. නමුත් එලෙසම ගම පුරා ඇවිදීමට අවදර නොලද මා ඇතුළු තවත් ළමුන් කණ්ඩායමක් ශබ්දය ඇසෙවාත් සමගම පාර අද්දරට දුව ගොස් අපේ බල්ලන්ටත් දානය බෙදා දී ගෙවල් පසු කර නොපෙනන දුරකට ජංගම දානේ රජය යන තෙක්ම බලා සිටිමින්ද එයට නොඅඩුව මිහිරක් වින්ද බව නම් සබෑවක්මය.

මගේ සිත තුල නොමැකෙන අයුරින් තැම්පත් වී ඇති තවත් එවැනි මතකයන් එන්නේ අපේ ගමේ සති දෙක තුනකට කිට්ටු කාලයක් තාවකාලිකව කූඩාරම් ගසා නතර වී සිටි අහිකුන්ටකයින් පිළිබඳ සිද්ධියකි.

අපේ ගෙදර වත්තේ තවත් එක් කෙලවරක් වන්නේ මගුරු ඔය නමින් හඳුන්වන කුඩ ඔයයි. දිගැල්ල නමින් හඳුන්වන අපේ ගම සහ පිදුරුවැල්ල නම් වූ අල්ලපු ගම වෙන් වන්නේද මගුරු ඔයෙනි. මෙම ඔයෙහි අනික් අනික් පැත්තේ පිදුරුවැල්ල ගමම අයිති කුඹුරු යායයි. මෙම කුඹුරු යායට අයිති පිල්ලෑවෙහි සති කිහිපයක් පදිංචි වී සිටි මෙම අහිකුන්ඨකයිනගේ කූඩාරම්, ඔවුන්ගේ ජීවනෝපාය ඔවුන්ගේ බඩු ඔසවාගෙන පැමිණි බූරුවන් වැනි සියළුම දේ එකල කුඩා ළමුන් වූ අපට මහත් කුතුහලයක් දනවන්නක් ම විය.

බූරුවන් පිට තබා බැඳගෙන පැමිණි තල් අහුරා ඔවුන් හදාගෙන තිබූ කූඩාරම් පාසල් නිවාඩු සමයට අපේ වැඩිහිටියන් අපට සාදා දෙන සෙල්ලම් ගෙවල් වලට වඩා විශාල වූයේ මද වශයෙනි. අපේ වත්ත කෙළවරෙහි වූ ඔය ඉවුරෙහි සරුවට වැවී තිබුණු උණ පඳුර ළඟට ගොස් බැලූ විට මෙම අපූරු අළුත්


